භූතෙ පන "නිච්චා ධුවා සස්සතා අවිපරිණාමධම්මා"ති වා

භූතයෝ වනාහි නිත්‍යයෝ ය.
සැමදා පවත්නෝ ය. වෙනස් නොවන ධර්මතා ඇත්තෝ ය.

භූතවාරාදිවණ්ණනා
සුත්ත අට්ඨකථා

සෑම සත්‍යයේ මාවතක් තුළම මුලාව රැඳී ඇත.
ඔබ එම පටු මාවත් හි ඇවිද යන කල්හි,
ඔබව මුලාව නම් වූ ආගාධයන් තුළට
ඇද වැටිය හැක.
ඒ නිසා,
සත්‍යයත්, මුලාවත් අතර ඇති හිඩැස
මනාව අවබෝධ කරගන්නා තුරු
ප්‍රවේසමෙන් ඇවිද යන්න.

11

ප්‍රථම මුද්‍රණය : 2023 දෙසැම්බර්

ISBN 978-624-5552-14-6

2023 @මුතුමුදලිගේ නිශ්ශංක

මුද්‍රණය

එස් ඇන්ඩ් එස් ප්‍රින්ටර්ස්

නො 27/18 ජයන්ත වීරසේකර මාවත

කොළඹ 10

සෝදුපත් පරීක්ෂාව

මිතුනි යසාරා

කවර නිර්මාණය

ප්‍රදීප් ප්‍රේමලාල්

පරිසනක පිටු සැකසුම

කාවින්ද්‍යා රත්නායක

මෙම පොතෙහි සියලුම හිමිකම් ඇවිරිණි. කර්තෘගේ අවසරය නිසි පරිදි ලිපියකින් නොලබා මෙහි එන කිසිවක්ම, මොනම ආකාරයකින්වත් නැවත පළ කිරීම තහනම් වේ. එම තහනමට: අතින්, යාන්ත්‍රිකව හෝ විද්‍යුත් ක්‍රමයකින් පිටපත් කිරීම, වීඩියෝ හෝ ඕඩියෝ ලෙස නිර්මාණය කිරීම, ඊ -බුක්, පිඩීඑෆ් ලෙස හෝ වෙබ් අඩවිවල පළ කිරීමද ඇතුළත් බව සලකන්න.

සියලුම හිමිකම් ඇවිරිණි. මුතුමුදලිගේ නිශ්ශංක 2023



This book is dedicated to
Paul, Sarah and Sev.

පෙර කියවීම

මිතුනි යසාරා

අෂාන් හරේන්ද්‍ර ද සිල්වා

හරිඳු උඩපිටිය

ප්‍රවේශය

මේ ත්‍රාස්‍යජනක, අද්භූත සහ කුතුහලාත්මක කතාව ඔබට පැවසීමට මත්තෙන් මා මෙම කතාවට සම්බන්ධ වූයේ කෙසේදැයි පාඨක ඔබ දැන ගත යුතු ය.

එකල මම 'දෙනියාවල' නමින් හැඳින් වූ කුඩා පළාතක පිහිටි එකම පොලිස් ස්ථානයෙහි පොලිස් ස්ථානාධිපතිවරයෙකු ලෙස සේවය කළෙමි. මා බිරිඳත් සමඟ විවාහ වී ගත වූ මුල් ම මාස තුන ඇතුළත මෙම උසස්වීම මා කරා ආයෙන් මෙය අපේ ජීවිතයට සිදු වූ වාසනාවක් යැයි සිතූ අප මෙම ගමන සඳහා පිටත් වූයේ බොහොම ප්‍රීතියෙනි. මීට කලින් දෙනියාවල ග්‍රාමයෙහි සේවය කළ පොලිස් ස්ථානාධිපතිවරයාගෙන් දැනගත් පරිද්දෙන්, දෙනියාවල සුන්දර, නිහඬ මනස්කාන්ත පරිසරයකින් යුත් සාමකාමී ගම්මානයකි.

ඉතින්, එවන් සුන්දර සාමකාමී ගම්මානයක් අලුතින් විවහා වූ යුවළකට වාසනාවක්ම නොවන්නේද? මා මෙන්ම මගේ බිරිඳත් සිතුවේ එසේ ය. පොලිස් ස්ථානාධිපතිවරයා විසින් දෙනියාවල ගම්මානය විස්තර කළ ආකාරය ඇයට කියද්දී ඈ එයින් බොහෝ ප්‍රීතියට පත් වූවා ය. කිහිප වාරයක් ම සිනහ සෙමින් මා වැළඳ ගත්තා ය.

"එහෙනම් මේක තමයි අපේ ජීවිතයේ සුන්දරම කාලේ, කවදාවත්ම අමතකම නොවන කාලේ" කියමින් සතුටින් තෙපළුවා ය. ඇයගේ සිනහවත්, ආලයත් හමුවෙහි මම ද බොහෝ සතුටට පත් වුණෙමි.

"ඔව්... නිසැකවම මේ අපේ ජීවිතයේ ප්‍රීතිමත්ම කාලය වේවී" මම ද ඇයට කීවෙමි.

ඒත්, එය එසේ වූයේ නැත...

අප බොහෝ සිහින මවමින්, ජීවිතයේ ප්‍රීතිමත්ම කාලය ගත කිරීමට සිතා දෙනියාවලට පා තැබූ මොහොතෙම මහා කුණාටුවක් පරිද්දෙන් මේ අද්භූත සිදුවීම් දාමය සිදුවීමට පටන් ගත්තේ ය. මුලින්ම සිදුවූයේ මිහිපිට කිසිවෙකුත් බලාපොරොත්තු නොවන තරම් වූ තුච්ඡ සහ මිලේච්ඡ ඝාතන සමූහයකි. එයින් පසුව එම ඝාතන පසුපස ඇති අද්භූත, භීතියෙන් පිරී ගිය තොරතුරු එකින් එක අනාවරණය වන්නටත්, මා හෝ අනෙකුත් නිලධාරීන් කිසිසේත්ම අපෙක්ෂා නොකළ ආකාරයෙන් මෙම අද්භූත කතන්දරය අවසන් වන්නටත් විය.

මෙම කතන්දරය නිසාවෙන් මමත් බිරිඳත් ප්‍රාර්ථනා කළ ඒ සුන්දර කාලය එහෙන් පිටින්ම උඩු යටිකුරු වී ගියේ ය. එය අප දෙදෙනාගේ ජීවිතය

අවාසනාවන්ත සහ කටුක කාලයක් බවට පත් කළේ ය. ඊටත් වඩා දෙනියාවලින් නික්ම ආ පසුවත් එම සිදුවීම් අපේ මනසින් ඉවත්කර ගැනීමට තරම් හැකියාවක් අපට නොවූයෙන්, එම සිදුවීම් සමඟ ම අපගේ ඉතුරු ජීවිත කාලය ගෙවා දැමීමේ අභාග්‍යසම්පන්න ඉරණමට මුහුණ පෑමටත් අපට සිදුවිය.

ඉතින් පාඨකය, මා ඔබට කියන්නට යන්නේ ඒ කතාව යි...

මා කලින් කී පරිද්දෙන් ම මෙය අද්භූත, ඔබ කිසිසේත්ම විශ්වාස නොකරන කරුණුවලින් පිරී ඇත්තා වූත්, විශ්මයජනක කතන්දරයකි. දිනෙක ඔබ මෙය කියවද්දි මා ජීවතුන් අතර නොසිටියහොත්, මතක තබා ගන්න - මේ ලියන්නා වූ සියලුම දෑ මා විසින් මුහුණ දුන්නා වූත්, දැසින්ම දුටුවා වූත් සත්‍ය කරුණු ය. මේ කරුණු සහ සිදුවීම්වල ඇති අතිශය ගුප්ත බව නිසා ඔබේ මනස විටින් විට මෙම ප්‍රශ්නය අසනු ඇත.

'මේ සියල්ලම ඇත්තක් ද?'

එවිට මා යළිත් පවසමි.

"මේ සියල්ලම මා මුහුණ දුන්නා වූත් දැසින්ම දුටුවා වූත් සත්‍ය කරුණු ය."

දෛවයේ කුමන හෝ අභාග්‍යකට මේවා ඒ ආකාරයෙන්ම සිදුවී ඇත.

අවසන් වශයෙන් -:

මෙම ඝාතනයන්හි සැබෑ මිනීමරුවා ලෙස කතාව කියවාගෙන යන ඔබගේ මනසට පුද්ගලයින් කිහිප දෙනෙකුගේ සේයාවන් දර්ශනය වනු ඇත. ඒත් ඒ කිසිවෙකුත් සැබෑ මිනීමරුවා නොවෙයි. ඔබ අවසානයේ දී සත්‍ය කතාව යැයි වටහා ගන්නා "කතාව"ද සත්‍ය කතාව නොවනු ඇත. මෙම සිදුවීම්වල ඇති "තුච්ඡකම" එය යැයි මා එකහෙළාම පවසමි. ඒ නිසා කිසිවක් කතාව අවසන් කිරීමට මත්තෙන් නිගමනය නොකරන්න. කතාව අවසන් කළ පසුවත් සිදුවී ඇති සත්‍ය සිදුවීම ඔබට වටහා ගත හැකිනම් එය ඔබේ දක්ෂතාවයත්, ඔබ කෙරෙහි ඇති රහස් විසඳීමේ අපූර්වත්වයත් නිසා විය හැක. ඒත් ඔබට එම නිගමනය කොතරම් නිවැරදිවම ගත හැකිදැයි මා නොදනිමි.

මෙම කතාව කියවන විට ඔබේ නිරීක්ෂණ ඇස සම්පූර්ණයෙන් ම අවදියෙන් තබා ගන්නැයි ඉල්ලා සිටිමින් මම කතාව ආරම්භ කරමි.

-: බැදූ ප්‍රතාප් රණසිංහ

11

අභිරහස් හැම තැනම ඇත. සෑම තොරතුරක් දෙසම හොඳින් අවධානය යොමු කළහොත් ඔබට එය විසඳීමට හැකිවනු ඇත.

1 වන දවස

මා වේගවත් වූයෙමි. ඇය කෑ ගසන්නට පටන් ගත්තා ය.

"ෂ්.... ඔච්චර හයියෙන් කෑ ගහන්න එපා" මගේ මුවින් නික්ම ආයේ සිනහවකි. එම සිනහවත් සමඟ ම එක් අතක් ඇයගේ තොල් මතට තැබූ මම ඇයගේ දෑස් දෙස බැලුවෙමි. ඇය එවිටම දෑස් විවර කළා ය. ඒවායේ ඇත්තේ කුමක්ද? ඒ ඇයගේ හදවතින් දැවී මුසපත් වෙමින් දෑස් මතට ආ රාගයම නොවේ ද? ඒවා දෙස බලද්දි මගේ ශරීරය ආලයෙන් පිරී ගියේ ය. මම ඇයගේ දෙතොල් මතින් අත ඉවතට ගෙන ඒ තොල් මතටම හාද්දක් දුන්නෙමි.

"හ්ම්.." ඇය හිසින් ඉඟියක් කළා ය.

"කෑ ගහන්න එපා" මම යළිත් කීවෙමි.

"ඔයා කියන්නේ ගෑනියෙක්ට කරන්න අමාරුම දේ" කී ඇය යළිත් දෑස් වසාගෙන මගේ ශරීරය ඇයගේ දෑතින්ම තද කර ගත්තා ය.

"අනික මේ ළඟපාත කවුරුවත් නැහැනේ. අනිත් ගෙය තියෙන්නේ ගොඩක් ඈතින්." ඇයගේ මුවින් නැගෙන්නේ සිහින් මිමිණීමකි.

"ඔව්... ඒක හරි" මම කීවෙමි.

"ඒත් මේ පළාත හරිම නිශ්ශබ්දයි. හුළං පාරත් එක්ක ගොඩක් ඈතට සද්දේ ඇහෙන්න පුළුවන්."

"ඉතින්.."

"ඉතින් මොකක්ද?"

"ඉතින් ඔයාට ලැජ්ජ ද?"

මා එක්වරම නැවතුණෙමි. ඇයගේ දෑසෙහි වූ රාගය නික්ම ගොස් ඒවාට හාස්‍යයක් ජනිත වී ඇත.

"නැහැ ලැජ්ජාවක් නැහැ" මම කීවෙමි.

"එහෙනම්.."

'මම කුමක් කියන්න ද?'

"මෝඩී..." මා ඇයගේ හාස්‍යයෙන් පිරී ඇති දෑස් මතට හාද්දක් දුන්නෙමි.

"ඕ... " ඇය මිමිණුවා ය.

"දෙනියාවල පොලිස් ලොක්කගේ ගෙදරින් රෑට රෑට සද්ද එන එක ගම්මුන්ට ඇහෙයි කියලා නේ?"

ඇය සිනාසුණා ය. මම ද සිනාසුණෙමි. ඒත් ඒ සිනහව තුළින් ඇය කියූ

දේත්, මගේ හිතට ලැජ්ජාව ආරෝපණය වූ ආකාරයත් මට පැහැදිලි විය. එය එසේ විය හැක. මෙය මා ලද ප්‍රථම උසස්වීම ය. එම උසස්වීම විවාහ වී මාසයක් ඇතුළත ලැබීම අපේ වාසනාවකි. ඊටත් වඩා අලුත බැඳපු යුවළක් දිනපතා ආලිංගනය කිරීමෙහි කුමන අරුමයක් ද? නමුත් මගේ ලැජ්ජාවට හේතුව මා දැරූ තානාන්තරය බැව් ඈ කීවේ සත්‍යයකි.

"හරි.. මම කෑ ගහන්නේ නැහැ.. හිමිහිට සිංදුවක් කියන්නම්... ඔයා කරන්න" ඈ යළිත් සිනහවකුත් සමඟ ම පවසමින් මගේ බෙල්ල වටා ඇයගේ දෑත් දමා ගත්තා ය.

"හ්ම්.. එහෙනම් සිංදුවක් කියන්නකෝ... ඔච්චර හයියෙන් කෑ ගහනවට වඩා ඒක හොඳයි." මම ද ඇයව යළිත් ශරීරයට තුළට ගත්තෙමි.

"ඒකට කියන්නේ කෑ ගහනවා කියලා නෙමෙයි මෝඩයා" ඇය මගේ කම්මුලට පහරක් ගසමින් දෑස් වසා ගත්තා ය.

***

මා යළිත් ඇඳට වැටුණේ දැඩි වෙහෙසකිනි. මගේ පපුව වේගයෙන් ගැහෙන්නටත්, සියල්ලම ශරීරයෙන් නික්ම ගිය පසුව එන හිස්බවින් මනස පිරී යන්නටත් වූයෙන් ඇඳට වැටුණු විගසම මා දෑස් වසාගෙන හති හරින්නට පටන් ගත්තෙමි. ඇය ද මා හා සමානව ම වේගයෙන් හති හරින්නට විය. ඒ සමඟ ඇය මගේ අතක් ඇයගේ තුරුලට ගෙන මහත් වූ ස්නේයකින් එය සිම්බා ය. සිඹින ගමන් "ඒකට කියන්නේ කෑ ගහනවා නෙමෙයි, කෙදිරිගානවා කියලා" යැයි කීවෙන් මා ඇය දෙසට හැරුණෙමි. ඇයගේ නිරුවත් සිරුර තවමත් උණුසුම් ය. ඇයගේ පැත්තට හැරෙද්දි එම උණුසුම මගේ ශරීරයට ස්පර්ශ වූයෙන් මා තවත් ඇයට තුරුලු වුණෙමි.

"දැන් නිදාගන්න. හෙට උදේම යන්නත් ඕන නේ" ඇය පියයුරුවලින් මාව තවත් තද කරගන්නා ගමන් මා වෙත තුරුළුවෙමින් කීවා ය.

"හ්ම්.." මම මිමිණුවෙමි. ඇයගේ උණුසුමේ ම දෑස් වසාගෙන නිදා ගැනීමට සැරසුණෙමි.

හෙට මා රැකියාවට යන "එකළොස්වන" දිනය යි. අලුත් පළාතට අලුතින්ම පත්වීමක් ගෙන පැමිණි පසුව ගෙවීගිය සෑම දිනක්ම මා හට අලුත් දිනයක් වූයෙන් එම දිනයන් තුළ සිදුවූ සෑම දෙයක්ම මට හොඳින් මතක ඇත. මා දිනයන් ගැන්නේ නැත. ඒත් මේ පළාතේ ඇති දැඩි නිහඬ බවත්, සාමකාමී බවත්, කාර්යබහුල නොවීමත් නිසාවෙන් ගෙවී ගිය දිනයන් සෑම එකක්ම මගේ මනසේ සටහන් වන්නට ඇත.

"හෙට එකළොස්වෙනි දවස.. අපි මෙහෙට ඇවිත් දවස් එකොළහයි." මා ඇයට කීවෙමි.

"මේ පළාත හරිම නිහඬයි. මිනිස්සුත් වැඩි කතා බහක් නැහැ. මට තේරෙන්නෑ ප්‍රතාප්, මේක ටිකක් ගුප්ත පළාතක්. හැබැයි මම කැමතියි මේ පළාතට. මේ නිහඬ සාමකාමීකමට... මම හිතන්නේ අපි මෙහෙට ආවේ අපේ වාසනාවට. ඔයාගේ මුල්ම උසස් වීම, ඉතින් ඒක කොච්චර හොඳද නේද?"

"ඔව්... වෙන පළාතකට පත්වීමක් ලැබුණ නම් හැමදේම මීට වඩා වෙනස් වෙන්න තිබ්බා" කී මම යළිත් දෑස් වසා ගැනීමට සැරසුණෙමි.

"හැමදේම හොඳින් සිද්ධ වෙයි." සුලෝචනා ද හැම රාත්‍රියකම නින්දට යන අයුරෙන්ම එම වචන පේළියත් කොඳුරමින් මට තවත් තුරුළු වූවා ය.

***

මා දෑස් වසාගෙන පැය කිහිපයක් ගෙවී යන්නට ඇත. කාමරයේ තිබුණු නිහඬබව එක්වරම අතුරුදහන් කරමින් ටිපෝව මත තබා තිබුණු මගේ රාජකාරී දුරකතනය නාද දෙන්නට පටන් ගත්තේය. එම හඬ ඇසෙත් ම මම ඉක්මනින්ම නැගිට ගත්තෙමි. මගේ බිරිඳ සුව නින්දක ය. ඇයට බාධා කළ නොහැක. දුරකතනයත් කනේ තබාගෙන කාමරයෙන් එළියට ගිය මම එයට පිළිතුරු දුන්නෙමි. ඒ මගේ සඟයා වූ උප පොලිස් පරීක්ෂක වේළුගේ කටහඬ යි.

"හෙලෝ සර්... "

"ඔව් වේළු"

"සර් ඉක්මනට මාදියාවෙල කණුව ගාවට එන්න. එතැනම තියෙනවා ලොකු බැංග්ලෝ එකක්."

වේළු දෙමළ අයෙකු වූවෙන් ඔහු සිංහල වචන උච්චාරණය කළේ මදක් වෙනස් ආකාරයට ය.

"මාදියාවෙල.."

"ඔව්, සර් ආපු දවසේ අපි තේ බීපු කඩේ.. අන්න එතැනම තියෙන හංදියට. එතැනින් උඩට හැරුණම තියෙනවා ලොකු බංගලාවක්."

"ඇයි මොකක්ද වෙලා තියෙන්නේ?"

"සූසයිඩ් කේස් එකක් සර්... මළකඳන් දෙකක් දැනටමත් ගොඩ ගත්තා."

"මොකක්..."

"ඔව් සර්.. මම කොස්තාපල්ලා දෙන්නෙක් එක්ක මෙතැන

සර් ඉක්මනටම එන්න" ඔහු කීවෙන් මම යළිත් කාමරය තුළට දිව ගියෙමි.

"කොහේ කියලද කිව්වේ?"

"මාදිවෙල හතරේ කණුව ළඟ තියෙන දෙනියාවල බංගලාවට.."

"හරි" මම ඇමතුම විසංධි කරනවාත් සමඟ ම කාමරයේ විදුලි ලාම්පුව දැල්වුවෙමි. ආ ඇමතුමේ බැරෑරුම්කම නිසාවෙන් ම මට සුලෝ සිටින්නේ තද නින්දේ බවත් අමතක වී ගොස් ඇත. මම විදුලි ලාම්පුව දල්වද් දී සුලෝ දෑසත් කුඩා කරමින් හිස ඔසවා බැලුවා ය.

"ප්‍රතාප් මොකක්ද වෙලා තියෙන්නේ?"

"ඉක්මනට යන්න ඕන සුලෝ, ඔයා නිදියන්න මම දොර වහලා යන්නම්" කී මම හැකි ඉක්මනින් ම පොලිස් ඇඳුම ඇඟ ලා ගත්තෙමි.

"මම ඔයාට තේ එකක් හදන්න ද?"

"එපා බබා... ඔයා නිදියන්නකො.." මා නිසාවෙන් ඇයගේ නින්ද කැඩීයාම ගැන මා පසුතැවිලි වූවෙමි.

නිල ඇඳුම ඇඳගත් පසුව අල්මාරියේ රහස් ලාච්චුව විවර කළ මම එහි වූ රිවෝල්වරය බඳපටියෙහි අසුරා ගත්තෙමි. රාජකාරියට අනුව රිවෝල්වරය උණ්ඩවලින් පුරවා තබා ගත හැකි වුවත් මම කිසිම දවසක එය පුරවා තබන්නේ නැත. එය නිරන්තරයෙන් ම ඇත්තේ උණ්ඩවලින් තොරව ය. මා එය කොපුවේ දාගනිද් දී සුලෝචනා සිහින් හඬින් මුමුණනු මට ඇසුණේ ය.

"අද එකළොස්වන දවස" මට එය නිවැරදිව ඇසුණේ නැත.

"මොකක්ද සුලෝ" මා ඇය දෙසට හැරුණෙමි. ඒත්, එවර මා විමතියට පත්වීමි. සුලෝචනා නින්දට ගොස් සිටියා ය. ඇයගේ තදින් හුස්ම ගන්නා හඬත් මට ඇසෙයි. ඇය කෙදිරුවේ නින්දෙන් ද? එසේ නැතහොත් එය පැවසූ පසුව ඇය නින්දට ගියා ද? මා දන්නේ නැත. එම විමතියත් සමඟ ම පොරෝනයෙන් විවර වී තිබුණු ඇයගේ නිරුවත් පියයුරු දකිද්දී මගේ මුව සිහින් සිනහවකින් වෙළී ගියේ ය. මා ඇය අසළට නැඹුරු වී පොරෝනයෙන් ඇයගේ උරහිස දක්වා වැසුවෙමි. ඇයගේ නළලටත් හාද්දක් දුන් මා විදුලි ලාම්පුවත් නිවා දමා කාමරයෙන් පිටවීමි.

***

නිවසින් පිටත් වී විනාඩි කිහිපයකින් ම මම මාදියාවෙල හංදිය කරා ආවෙමි. වේළු කියූ ආකාරයටම මම දෙනියාවලට පැමිණි මුල්ම දවසේ වේළු මාව කැඳවාගෙන ආයේ මේ අසළ ම ඇති තේ කඩයකට ය. මම මාර්ගය දෙපස විමසිල්ලෙන් බලමින් තේ කඩයත් පසු කරමින් ඉදිරියට ඇදුණෙමි. මාවත නිහඬ ය. දැඩි අන්ධකාරයකින් සහ නිශ්චලභාවයකින් යුක්ත ය. පොලිස් ජීපයේ වේගයත් සමඟ ම ශීතල සුළං පාරක් ජීපය තුළට හමා එන්නට විය. මම පහත් වී විවරව තිබුණු ජනේලය වසා දැමීමට සැරසුණෙමි. ඒත් සමඟ ම මා පිටුපසින් වේගයෙන් ඉදිරියට එන සයිරන් හඬක් ඇසුණෙන්, ඉක්මනින් ම ජීපයේ වේගය අඩාල කළ මම එය මාවතේ අයිනකට ගෙන ආවෙමි. පිටුපසින් ඇසෙන්නේ ගිලන් රථයක සයිරන් හඬක් විය යුතු ය. එය මාදිවෙල පාරේ ඈතක සිට මා දෙසට වේගයෙන් ඇදී එයි. මම ජීපය සෙමින් පදවන ගමන්

පැති කණ්ණාඩිය දෙස විමසිල්ලෙන් බලා සිටියෙමි.

මා සිතූ ආකාරයටම එය ගිලන් රථයකි. ඊයක වේගයෙන් මාදිවෙල මුලු වීදියම දෙවනත් කරන හඬකුත් සමඟ ඉදිරියට ආ එය, ඇසිල්ලකින් ජීපය ද පසුකරගෙන ඉදිරිපස වංගුවෙන් ද අතුරුදහන් වී ගියේ ය. මමද ජීපයේ වේගය තවත් වැඩි කොට එය පසු පස හඹායන්නට විමී. වේළු කියූ ආකාරයට දෙනියාවල බංගලාව තුළ මරණයක් සිදුවී ඇත්නම් නිසැකවම මෙම ගිලන් රථය යන්නේද ඒ දෙසට විය යුතු ය.

***

මම ඇක්සලේටරය තවත් තදින් පෑගුවෙමි. ගිලන් රථයේ වේගයටම ජීපයද ඒ පසුපසින් ඇදෙන්නට විය. මාවත දිගේ වේගයෙන් ඇදී ගිය ගිලන් රථය වංගු කිහිපයක් හරවා ඉන්පසුව මාදිවෙල හතරේ කණුවෙන් වම්පසට වූ කෙටි පාරකට හැරවූයේ ය. එය පටු වැලි පාරක් වූයෙන් ගිලන් රථයේ වේගය අඩාල විය. ඒත් එහි සයිරන් හඬ මුළු පළාතම දෙදරවමින් ඇසෙයි. එම හඬෙහි වූ දැඩි බවින් රාත්‍රියේ නිහඬ බව මුළුමනින්ම සේදී ගිය නිසාවෙන් මගේ සිතට ආවේ කෝපයකි.

'මොකෙක්හරි බූරුවෙක්' මම මිමිණුවෙමි. මෙවන් රාත්‍රියක මේ තරම් උච්ච හඬකින් සයිරන් හැඬවීම නොකළ යුත්තකි. එයින් ප්‍රදේශයේ මිනිසුන් කලබල වනවාක් සේ ම, මේ හඬ නිසාවෙන් ඔවුන් තම නිවෙස්වලින් එළියට බැස, මේ නිවස වටා රොක් වනු ඇත. වේළු කියූ ආකාරයට නිවස තුළ මරණයක් වී ඇත්නම් එය පරීක්ෂණ කටයුතුවලට බාධාවකි.

ගිලන් රථය වැලි පාර දිගේ ගොස් එහි කෙළවර වූ අඹලන් ව ගිය ගේට්ටුවකින් ඇතුළට කර නතර කළේ ය. මමද ජීප් රථය ගිලන් රථය ආසන්නටයටම ගෙන ගොස් නතර කෙරුවෙමි. මට එය පදවන පුද්ගලයා කවුරුන්දැයි බලා ගැනීමට අවශ්‍ය විය. මම ජීපය නතර කරත් ම ගිලන් රථයේ රියදුරු යැයි සිතිය හැකි, ජනේලයට ආසන්නයේම සිටි දමිළ තරුණයෙකු බයාදු සිනහවක් සමඟ ඉවතට එබී "ස'රුත් අපේ පස්සෙන්ම ආවානේ" යි ඇසුයෙන් මා එයින් තවත් කෝපයට පත්වීමි.

"අයිසේ.. බූරුවෙක් වගේ වාහන එළවන්න එපා" මම ඔහුට කෑ ගැසුවෙමි.

"මේ වගේ වෙලාවක මහා හයියෙන් සයිරන් ගහන්නේ තමුසෙට ඔල්මාදෙ ද?"

මගේ කටහඬෙන් කොල්ලා බියට පත්වන්නට ඇත. ඔහු කිසිවක් නොකියාම, ගිලන් රථය තවත් ටිකක් ඉදිරියට පදවා නිවසෙහි මිනිසුන් ගැවසුණු පැත්තකට ගෙනගොස් එය නතර කළේ ය. මම හිස්වැස්මත් දමාගනිමින් ජීපයෙන් බිමට බැසගත්තෙමි.

ඒත් සමඟ ම වේළු ගනේෂන් නොහොත් "වේළු" යනුවෙන් අපි කෙටි නමකින් හඳුන්වන දෙනියාවල පොලිස් ස්ථානයේ උප පොලිස් පරීක්ෂකවරයා මා ඉදිරියට එන්න විය. දෙමළ හාදයෙක් වූ වේළු කෙට්ටු, උස සිරුරකින් සහ කාලවර්ණ සමකින් යුක්ත වූ අයෙකි.

"සර්" ඔහු සැලියුටයක් ගසමින් ආමන්ත්‍රණය කළේ ය.

"වේළු ... මොකක්ද වෙලා තියෙන්නේ?"

"සර්, අර පේන ළිඳ ඇතුළේ මළසිරුරු කිහිපයක් තියෙනවා" ඔහු එක අතක් දික් කර අපට මදක් ඈතින් වූ ස්ථානයක් පෙන්වා කීවේය. අන්ධකාරය නිසාවෙන් එම ස්ථානයේ විමිනි ලාම්පු කිහිපයක් පත්තු කර ඇති අතර කොළුවා පැදවූ ගිලන් රථය ද එතැන වූ ළිඳ දෙසට හරවා විදුලි ලාම්පු දල්වා නවත්වා ඇත. මා ඒ පැත්තට හැරෙත්ම රාත්‍රී සුළඟත් සමඟ හමා ආ දැඩි දුර්ගන්ධයකින් මගේ සිරුර පිළිකුලින් ඇඹරී යන්නට විය. සාක්කුවට අතක් දැමූ මම එයින් ගත් ලේන්සුවකින් නාසය ආවරණය කර ගත්තෙමි. වේළු ද නාසය ලේන්සුවකින් තද කරගත්තේ ය.

"දැනටමත් කුණුවෙලා සර්. ඒකයි ඔය ගඳ" ඔහු කීවේ ය.

"මළසිරුරු කීයක් ද?"

"දැනට දෙකක් ගොඩ ගත්තා සර්. අපි තව හොයනවා. මේක ටිකක් ගැඹුරු ළිඳක්. අඩි සීයකටත් වැඩියි. ඇතුළට බැහැලා ඉන්න මනුස්සයා කියනවා තව එක බොඩි එකක් පතුලේ හිරවෙලා තියෙනවලු."

"මොකක්?" මම ඒ දෙසට යන්නට වීමි. එවිට එම ස්ථානයෙන් වහනය වූ දුර්ගන්ධය තව තවත් වැඩි වන්නට විය. එය ඉහිලිය නොහැකි වූ තරම් දැඩි ගඳකි.

"මෙච්චර ගඳක් එන්නේ දවස් ගානක් පල් වෙලා වගේ" මම කීවෙමි.

"ඔව් සර්.. බොඩීස් දෙකම වතුරට ඉදිමිලා. මුහුණවල් එහෙම එහෙන් පිටින්ම සවුත්තු වෙලා" වේළු පිළිකුළකින් කීවේ ය.

***

අපි එම ස්ථානයට ළඟාවෙත් ම විමිනි ලාම්පු අත තබා සිටි කොස්තාපල්වරුන් දෙදෙනෙක් සැලියුටයක් ගසා ඔවුන් අත වූ ලාම්පු ළිඳ දෙසට දික් කළහ. මා එම මළසිරුරු දෙස විමසිල්ලෙන් බැලුවෙමි. වේළු කියූ ආකාරයට ම එතැන මළසිරුරු දෙකක් ඇත. එයින් එකක් කාන්තාවකගේ මළසිරුරක් වන අතර අනික පිරිමියෙකුගේ සිරුරකි. එම සිරුරු දෙකම ඉදිමී, කුණු වී තිබුණෙන් ඒවායින් හමන්නේ දැඩි දුර්ගන්ධයකි. මම ලේන්සුවෙන් නාසය තවත් තදකරගන්නා ගමන් හිස ඔබා ළිඳ ඇතුළත බැලුවෙමි. ළිඳ තුළට දැමූ කඹයක් අල්ලාගෙන තවත් මිනිසෙක් ළිඳට බසිමින් ඇත. අඩක් දුර බසිමින් සිටි ඔහු

කඹයත් අල්ලාගෙන නැවතුණේ ය. කුණු වූ මළසිරුරු දෙකක් ගොඩගත් ළිඳක් තුළට බැසීමට ඔහු පිළිකුල් කරන්නට ඇත.

"වේළු ඇතුලේ තව බොඩි එකක් තියෙනවා කියලා විශ්වාස ද?"

"ඔව් සර්, තව එකක් තියෙනවා කියලා ඔය මනුස්සයම තමයි කිව්වේ" ඔහු ළිඳ තුළ සිටි මිනිසා දෙස බලන ගමන් කීවේ ය.

"ඔය ගුණපාල.. මේ ළඟ ඉන්න කෙනෙක්. ළිඳේ බොඩීස් දෙකක් පාවෙනවා කියන ආරංචිය ආපු හැටියම මම මිනිහව වැඩේට ගෙන්න ගත්තා. හැබැයි ඕකට ආයෙමත් බහින්න මිනිහා අදිමදි කරනවා" වේළු ලේන්සුවෙන් නාසය වසා ගන්නා ගමන් ම ළිඳ ඇතුළට එබී එහි එල්ලෙමින් සිටි මිනිසාට කතා කරන්නට විය.

"ගුණපාල, අනිත් බොඩී එක එළියට ගන්න පොටක් නැද්ද?" ඔහු ඇසූයෙන් ළිඳ තුළ සිටි මිනිසා හිස ඔසවා උඩ බැලුවේ ය.

"පුළුවන් සර්.. මට හුස්ම අල්ලගෙන විනාඩි දහයක්වත් ඇතුළට යන්න වෙනවා. ඒ මළකඳ මොකකින් හරි බැඳලා දාලා වගේ ළිං පතුලේ හිරවෙලා තියෙන්නේ. ඇතුළට ගිහින් ආයේ බලලා තමයි එළියට ගන්න ක්‍රමයක් හිතන්න වෙන්නේ" ඔහු කීවේ ය.

"හරි බලනවකෝ.. ගොඩගන්න බැරිමනම් අපිට බැකෝ එකක්වත් ගේන්න වෙනවා" කී වේළු මා දෙස බැලුවේ ය. මා ඒ වන විට හිටගෙන සිටියේ ළිඳ පාමුල ගොඩ ගසා තිබුණු මළසිරුරු දෙක අසළ ය.

"සර්.. ඔය දෙකෙන් එකක කැපුම් පාරවල් තියෙනවා" කී ඔහු සාජන්වරයෙකුගේ අතේ වූ ලාම්පුවක් ගෙන එතැන වූ එක් මළ සිරුරකට ළං කළේ ය. මම ද පාත් වී ඒ දෙස බැලුවෙමි. පිරිමි මළ සිරුරේ බෙල්ලේ කැපුම් පහරවල් කිහිපයකි. වතුරට පල් වීම නිසාවෙන් එහි ඇතුල් සම එළියට ඉලිප්පී ඇවිත් තිබුණෙන් මා පිළිකුලෙන්ම දෑස් ඉවතට ගත්තෙමි.

"අනිත් එක" මා කාන්තා මළසිරුර දෙසත් බලන ගමන් විමසුවෙමි. ඇය ඇඳ සිටින්නේ කොළ පැහැති ගවුමකි. ශරීරය ඉදිමීම නිසා ගවුමේ තැන් තැන්වලින් මාංශයන් එළියට ඉලිප්පී ඇත.

"නැහැ සර්.. පිටතින් පේන්නනම් මුකුත් නැහැ" වේළු කීවෙන් මම එතැනින් ඉවත් වීමට වෑයම් කෙරුවෙමි. ඒත් සමඟ ම එතන සිටි කිසිවෙකු මුමුණන හඬක් මට ඇසුණේ ය.

"ඔය මේ බංගලාවේ පොඩි හාමු. අනිත් කෙනා එයාගෙම උන්දෑ."

එම කටහඬ මට ඇසෙත් ම මා යළිත් පිටුපස හැරී බැලුවෙමි. එතැන සිටියේ මැදි වියේ පිරිමි පුද්ගලයෙකි.

"තමුන් කවු ද?"

"මම සේන. අර එහා පැත්තේ ගෙදර ඉන්නේ.. මම තමයි අද රාත්‍රියේ පොලීසියට ඔත්තුව දුන්නේ" කී ඔහු තවත් ටිකක් මා අසළට නැඹුරු විය.

"ඊයේ උදේ ඉඳන් මේ ගේ පැත්තෙන් ගඳක් එන්න ගත්තා සර්. මම විපරම් කළා සතෙක්වත් කුණු වෙලා ද කියලා, ඒ ගඳ මාන කරගෙන මේ පැත්තට ආවමයි දැක්කේ අර දොරත් හෝ ගහලා ඇරලා දාල" ඔහු නිවසේ ප්‍රධාන දොර දෙසට හැරෙමින් කීවේ ය.

"ඉතින් ගෙදර කවුද හිටියේ?" මම ඇසුවෙමි.

"කවුරුත් නැහැ සර්. මම ගෙදරට කිහිප වාරයක්ම තට්ටු කරලා, ගේ වටේ කැරකිලත් බැලුවා. කිසිම හැල හොල්මනක් නැහැ. ඔහොම පිටුපස්සෙන් ගිහින් මෙහෙට හැරෙද්දී තමයි ගන්දස්සාරේ එන්නේ මේ ළිඳ පැත්තෙන් කියලා තේරුණේ. ඉතින් මම සැකේට වගේ ඔළුව දාලා ළිඳ ඇතුළ බැලුවා. එතකොට ඔය මළකඳන් දෙක ළිඳේ පාවෙනවා" කී ඔහු කරේ තිබුණු රෙදි කඩක් ගෙන නහය වසා ගන්නා ගමන් මළකඳ දෙස බලා උගුර කාරා පොළොවට කෙල ගැසුවේ ය.

මා යළිත් ඔහුගේ මුහුණ දෙස බැලුවෙමි. අන්ධකාරය නිසා ඔහුගේ මුහුණ හරි හැටි නොපෙනෙතත් ඔහු දැඩි කාල වර්ණ සමකින් යුක්ත වූ, උඩුකය නිරුවත්ව සිටි, වයස අවුරුදු පනහක පමණ කෙනෙකු විය යුතු ය. ඔහු කාරා කෙල ගැසූ ආකාරයෙන් එසේ කළේ මළකඳන් වලින් වහනය වන දුර්ගන්ධය නිසාද එහෙමත් නැතහොත් ඔහුගේ සිතේ මේ පවුල කෙරෙහි ඇති කුමක් හෝ කෝපයක් නිසාදැයි යන ප්‍රශ්නය මගේ සිත තුළ ඇති විය.

"තමුන් මේ ළඟ කිව්වනේ?"

"ඔව් සර්, මේකට එහා පැත්තේ ගෙදර."

"හරි, තව ටිකකින් පොලිසියට ඇවිත් සේරම විස්තරේ කියන්න ඕන. පොත්වල සටහන් කරගන්න" එම සැකය නිසාම ඔහුට පැවසූ මම එතැනින් නික්ම නිවස වටා ඇවිදින්නට පටන් ගත්තෙමි.

***

අපරාධය සිදු වූ ස්ථානයේ කරන මුල්ම පරීක්ෂණය ඉතාමත් වැදගත් එකකි. බොහෝ විට අපරාධය ගැන හොඳම හෝඩුවාව ලැබෙන්නේ එම ස්ථානයේ සිදුකරන මුල්ම පරීක්ෂණය තුළින් ය. අපරාධ විද්‍යාවට අනුව "අපරාධයක සියයට පනහක්ම අපරාධය සිදුවූ ස්ථානයේ කරන මුල්ම පරීක්ෂනය තුළින් විසඳා ගැනීමට හැකිවනු ඇත, නමුත් එය අපරාධ පරීක්ෂණය මෙහෙයවන තැනැත්තාගේ ඉව, බුද්ධිය සහ හැකියාව මත රඳා පවතින්නකි." ඒ නිසාම මා හිතාම සූක්ෂමව, මම ඒ මොහොතේ හිටගෙන සිටි, බංගලාවේ සෑම පැත්තක් ගැනම අවධානය යොමු කරන්නට වීමි.

මෙය ප්‍රමාණයෙන් විශාල බංගලාවකි. එය වටා සම්පූර්ණයෙන්ම ඇවිදින්නෙකුට ඒ කාර්‍යයට විනාඩි දහයක්වත් ගත වනු නිසැක ය. කාලයක් හිතාම විරාජමානව වැජඹෙන්නට ඇතැයි සිතිය හැකි මෙම බංගලාව පැරණි රදල නිවෙස්වල ආකෘතියෙන් ඉදිකර ඇත. නමුත් මේ වෙද්දී එහි බිත්ති පවා තැනින් තැන කඩා වැටී, බංගලාවේ එක් පැත්තක් බිමට බර වී ඇත්තාක් සේ ළිඳට ආසන්නයේ වූ වහලය පැත්තකින් බිමට නැඹුරු වී ඇත.

"මේ ගේ කාලෙකින් නඩත්තු කරලා නැහැ සර්. මම හිතන්නේ එහෙම කරන්නවත් මේ මිනිස්සුන්ට වත්කමක් තියෙන්න නැතිව ඇති" මම පහත් වී තිබුණු වහලය දෙස බලද්දී වේළු කියන්නට විය.

"ඔය මැරුණු දෙන්නා විතරද මේ ගෙදර ඉඳලා තියෙන්නේ?"

"නැහැ සර්.. මම දන්න විදියට 'වින්සන්ට් හාමු' කියන කෙනාගේ අම්මත් ජීවත් වුණේ මේ ගෙදර. තව පොඩි ළමයි කිහිප දෙනෙකුත් හිටියා. හැබැයි මේ වෙද්දී නම් කවුරුවත් නැහැ. අර ළිඳ ගාව තිබුණ මළකඳන් දෙක හැරෙන්න."

"එතකොට කෝ හිටියා කිව්ව ළමයි?" මම ඔහුගෙන් යළිත් ඇසුවෙමි.

"දෙයියෝ තමයි සර් දන්නේ... මම ගේ හැම තැනම සෝදිසි කළා. ගෙදර කවුරුවත් නැහැ. ඔය ගෙදරම මැද තීරුවෙන් වෙන් කරලා එහා පැත්තේ කොටසේ තමයි 'වින්සන්ට් හාමු' කියන කෙනාගේ අම්මා ජීවත් වුණේ. ඒ ගැහැනු කෙනත් නැහැ... සේරම අතුරුදහන් වෙලා."

"අතුරුදහන්? එහෙම අතුරුදහන් වෙන්නේ කොහොමද අයිසේ?" මම මිමිණුවෙමි.

ඒත් සමඟ ම එතැනම, ඊට නුදුරෙන් නවත්වා තිබුණු පොලිස් ජීපයට ගිය මම එය පණගන්වා ජීප් රිය බංගලාවේ ප්‍රධාන දොර ඉදිරියට ගෙන ගොස් විදුලි ලාම්පු ඒ දෙසට හරවා නතර කළෙමි. එහි ආලෝකයෙන් බංගලාවේ ඉදිරිපස පෙදෙස යහමින් පෙනෙන්නට විය.

"වේළු, තව කොස්තාපල් කෙනෙක්ටත් එන්න කියන්න. ආයේ චෙක් කරමු" යි කී මම ජීපයෙන් ගත් විදුලි පන්දමක් ද සමඟ යළිත් පහතට බැස ගත්තෙමි. වේළු ද ලාම්පුවක් අතැතිව සිටි කොස්තාපල් කෙනෙකු සමඟ එතැනට පැමිණියේ ය.

***

අපි බංගලාවේ සෝදිසිය පටන් ගත්තෙමු. ඒ වන විට වෙලාව අලුයම හතරට ආසන්නව තිබිණ. ආකාසය තවමත් අන්ධකාර මුත් තවත් හෝරා කිහිපයකින් ම එය ආලෝකමත් වනු ඇත. විදුලි පන්දමත් දල්වාගත් මම වේළු සහ කොස්තාපල් සමඟ බංගලාව තුළට ඇතුල් වූයෙමි.

එය පිටතින් බංගලාවක් සේ නොපෙනෙන්නාක් සේම, ඇතුළතින් ද එසේ

නොපෙනෙයි. පිටතින් දිරාපත් වී ඇත්තාක් සේම ඇතුළ ද අභාවයට ගොස් ඇත. බංගලාවට ඇතුළු වීමට ප්‍රධාන දොරවල් දෙකක් ඇති අතර එම දෙක මැදින් බිත්තියක් බැඳ, නිවස කොටස් දෙකකට කඩා වෙන් කරන්නාක් මෙන් දෙකට බෙදා ඇත.

"ඕක පැති දෙකකට වෙන් කරලා සර් තියෙන්නේ. මේ පැත්තේ තමයි අර මැරිලා හිටිය හාමුයි, ගැහැනු කෙනයි ජීවත් වුණේ."

අපි ඉදිරිපස කොටසට එත්ම වේළු කීයෙන් මම පන්දම එහා පැත්තට හැරවූයෙමි.

"අර පැත්ත?"

"ඒ පැත්තේ හාමුගේ අම්මා."

"අතුරුදහන් කිව්ව කෙනාද?"

"ඔව් සර්.. මම අර කලින් කතා කරපු කෙනාගෙනුත් ඇහැව්වා. මිනිහත් කියනවා මෑතක් වෙනකන් ම ඒ අම්මවයි, දරුවන්වයි මේ ගෙදර දැක්කා කියලා. එකපාරම එහෙම අතුරුදහන් වෙන්න විදියක් නැහැ" වේළු කීවෙන් මම නිවසේ එහාපස කොටසට යන්නට පටන් ගත්තෙමි.

"මේ පැත්තෙන් පටන් ගමු."

***

එදින හෝරාවක් පමණ යනතුරු අපි බංගලාවේ දෙකොටසම පරීක්ෂා කරන්නට වීමු. ඒත් බංගලාව තුළ කිසිවෙකුවත් හමුවුයේ නැත. එහි ජීවත් වූවායැයි කියූ දරුවන් නිවසේ කොහේ හෝ සැඟවී ඇත්දැයි සැකයෙන් අපි බංගලාවේ වූ සෑම බිම් අඟලක් ම පරීක්ෂා කෙරුවෙමු. කොටින්ම වේලු සහ කොස්තාපල්වරයාගේ උදව්වෙන් බංගලාවේ කාමරවල අල්මාරි, සැඟවුණු තැන් සහ ඇඳන් යට පවා අපි පරීක්ෂා කෙරුවෙමු. ඒත් එහි සැඟවී සිටින හෝ අඩුම තරමින් මිය ගොස් සිටින කෙනෙකුගේ වුව, සිරුරක්වත් අපට සොයා ගත හැකි වූයේ නැත.

වේළු කියූ ආකාරයටම එහි සිටි අය අතුරුදහන් වී ඇත. සමහර විට බංගලාවේ ජීවත් වූ මහළු කාන්තාව මේ මිනීමැරුම් සිදුකොට ඇය සමඟ සිටියා යැයි කියන දරුවන් තිදෙනාත් සමඟ පලා යන්නට ඇත. එසේත් නැතහොත් ඇය කාගේ හෝ උපකාරයෙන් මේ සියල්ලම අවසන් කොට එම තැනැත්තාගේ උපකාරයෙන් ම මෙතැනින් පිටවන්නට ඇත. ඒ දෙකම සිදුවී නැත්නම්; අපිට අනුමාන කළ නොහැකි කුමක් හෝ වෙනත් අද්භූත සිදුවීමක් මෙම නිවස තුළ සිදුවන්නට ඇත.

එය සිතත්ම මගේ රෝම කූපයන් සියුම් වූ භීතියකින් හිරිවැටී ගියේ ය. මම වේළු දෙස බැලුවෙමි. අන්ධකාරයේම පෙට්‍රෝල් ලාම්පුවත් අතින් ගත්

කොස්තාපල්වරයා සමඟ ම ඔහු මා පිටුපසින් හිටගෙන සිටියේ ය.

"මෙතන මොකක්හරි දෙයක් සිද්ද වෙලා තියෙනවා, මොකක් හරි භයානක දෙයක්" මා ඔහුට කීවෙමි. මට එය දැනිණ. පොලිස් වෘත්තියට විත් වසරක්වත් නොමැති වුවත්, යමක් සිදුවීමේදී එහි දකින ප්‍රමාණය අනුව ඉතිරිය කොතරම් භයානක වන්නට ඇත්දැයි කියත හැකි ඥානයක් මට තිබිණ. මම පොලිස් ස්ථානාධිපතිවරයෙකු ලෙස පත් වූයේ අත්දැකීම් තුළින් නොව බුද්ධියෙනි. වසරක් පුරාවට නීතී ක්ෂේත්‍රයෙත්, ආරක්ෂක අංශයේත් උපාධීන් සම්පූර්ණ කළ මා, කිසියම් වූ ඥාන සම්භාරයකුත් සමඟ එස්. අයි. වරයෙකු බවට පත්ව වසරක ඇවෑමෙන් පොලිස් ස්ථානාධිපතිවරයෙකු ලෙස උසස් වීමක් ද ලබා ගත්තෙමි. ඒ නිසාම යටත් පිරිසෙන් මා විසින් කියූ මට හිමිව තිබුණු සහජ බුද්ධිය නිසාම මෙම නිවස දකිත් ම, අන්ධකාරයේ ම මෙම නිවස තුළට පිවිසෙත් ම, මෙය අප සිතන තරම් සාමාන්‍ය දෙයක් නොවනු ඇතැයි යන සැකය මා තුළ ජනිත වන්නට විය.

"ඔව්.. සර්, එක්කෝ අර ගෑනී මේ දෙන්නව මරලා මෙතැනින් පැනලා ගිහින්" වේළු කීවේ ය.

ඔහු එසේ පවසද්දි අපි සිටියේ දෙවැනි නිවසෙහි එක්තරා කාමරයක් තුළ ය. එම කාමරය අඳුරේ පැවතුණේ ය. වේළු එම වචනය පිට කරත් ම මගේ සිත මා ඔබට කියූ එම සංවේදී චකිතයෙන් තිගැස්සී ගියේ ය. මගේ රෝම කූපයන් කිසියම් වූ බලයකින් සීතල වන්නාක් මෙන් ඉහළට එසවී ආවේ ය.

"නැහැ" මම මිමිණුවෙමි. මම එය කීවේ ඇයි දැයි මා දන්නේ නැත. ඒත් එය මට දැනුණේ ය.

"මොකක්ද සර්?" වේළු ඒ මොහොතේ මා අසළට ආවේ ය.

"වේළු" මම මිමිණුවෙමි.

(පාඨකයිනි, මා ඔබට කියූ ආකාරයටම අප සිටියේ අන්ධකාර වූ කාමරයක ය. වේළු මා පිටුපසින් සිටගෙන සිටි අතර ඊට නුදුරින් චිමිනි ලාම්පුවක් අතින් ගත් සාජන්වරයා සිටගෙන සිටියේ ය. ඔබ දන්නා පරිද්දෙන් මගේ අතෙහි ද විදුලි පන්දමක් විය. මේ කාමරයට ඇතුළු වූ මොහොතේම වේළු කුමක් හෝ හේතුවක් නිසාවෙන් මෙම නිවසේ සිටි මහළු කාන්තාව ගැනත්, එම දරුවන් ගැනත් කතා කරන්නට පටන් ගත්තේ ය. හරියටම ඒ මොහොතේ ඔහු එසේ කතා කරද්දී - අප තිදෙනාම මෙම කාමරය මැද හිටගෙන සිටි ඒ මොහොතේ - මට එය දැනිණ. මගේ සම හරහා ඇදී ගිය සීතලත්, එයින් පොපියමින් ඉලිප්පී ආ මගේ රෝම කූපයනුත් සමඟ ම එම මහළු කාන්තාව ගැන වේළු කතා කරද්දී; "මේ දෙන්නවත් මරලා ඒ ගැහැනි ගෙදරින් පැනලා යන්න ඇති" ඔහු පවසද්දී; එය සම්පූර්ණයෙන් ම සාවද්‍ය බැව් මගේ චෛතසිකයට දැනුණේ ය. එම දැනීමත් සමඟ ම මා එතැනම සිටගත්තේ ය. මා සෙලවුණේවත්, කාමරයෙන් පිටවීමටවත් අදහස් කළේ නැත.)

"වේළු" මම හිස නොඅරවා ම මා පිටුපස සිටි මගේ සහයකයාට කතා කෙරුවෙමි.

"සර්..."

"පිටිපස්ස හැරෙන්න එපා. කොස්තාපල්ට කියන්න ටිකක් ඉස්සරහට එන්න කියලා" කී මම එක එල්ලේ ම මට ඉදිරියෙන් පෙනෙන දර්පණය දෙස බලා සිටියෙමි. එම දර්පණයේ වූ ප්‍රතිබිම්බයෙන් මට පිටුපසින් වූ කොස්තාපල්ගේ ඡායාවත්, ඔහු අතේ වූ චිමිනි ලාම්පුවේ ආලෝකයත්, මා අසළ ම සිටින වේළුව සේ ම අපට පිටුපසින් ඇති කාමරයේ විවර වී ඇති දොරත් පෙනෙයි.

"ඇයි සර් මොකක්ද වෙලා තියෙන්නේ?"

මගේ කටහඬෙහි වූ වෙනස්කම නිසා වේළු ද සලිත වන්නට ඇත.

"ප්‍රශ්න අහන්න එපා. එයාට කියන්න පොඩ්ඩක් ඉස්සරහට එන්න කියලා. කොස්තාපල් ඉන්නේ දොර මැද." මා එසේ කියත් ම වේළු ද මා කියූ පරිදිම කොස්තාපල් දෙස නොබලාම;

"සාජන් මෙතැනට එන්න" යැයි කීයෙන් ඔහු මදක් ඉදිරියට ආවේ ය.

මා දර්පණය දෙස බලා සිටියෙමි. ඔහු දොරෙන් ඈත් වෙත් ම දොර අසළ සිටගෙන සිටි ඇය දොරෙන් ඇතුළට ආවා ය. එසේ විත් කාමරයේ පැත්තකින් වූ ඇඳ මත හිඳ ගත්තා ය. මා ඇය දෙස බැලුවේ නැත. ඒ දෙස බැලීමට වුවමනාවක් ද මට තිබුණේ නැත.

"හරි අපි යමු. නවතින්න එපා. ඔහොමම එළියට යන්න" කී මම කිසිම දේකට සැළකිල්ලක් නොදක්වන ආකාරයෙන් කාමරයෙන් එළියට ආවෙමි. වේළු සහ කොස්තාපල්වරයා ද මගේ පසු පසින් ආවේ ය.

අහෝ! කාමරයෙන් එළියට ආ පසුව හැකි ඉක්මනින් ම යළිත් මිදුලට පැමිණි මා වේගයෙන් හුස්ම ගතිමි. මගේ හදවත වේගයෙන් ගැහෙන්නටත්, කාමරය තුළදී සිරකරගෙන සිටි එම අතෘප්තිකර, දැඩි භීතියෙන් මාව එක් වරම වෙළී යන්නටත් විය. මා දෑස් විශාල කොටගෙන අපි සිටි ස්ථානයේම ගල් ගැසී සිටගෙන වේගයෙන් හුස්ම ගන්නට වීමි.

"ඇයි සර්, මොකක්ද වුණේ?" යි වේළු මා අසළට නැඹුරු විය.

"මුකුත් නැහැ" මා ඔහුට කීවෙමි.

"වේළු, අර බොඩීස් දෙක හොස්පිටල් එකට යවන්න. මම ෆොරෙන්සික් එකට පණිවිඩයක් යවන්නම්" කී මම විදුලි පන්දම නිවා දමා ජීපයේ හිඳගත්තෙමි. ආකාසය ක්‍රමයෙන් ආලෝකමත් වෙමින් ඇත.

"වේළු.." මා යළිත් ඔහුට කතා කළෙමි.

"ඔව් සර්.."

"මොනම හේතුවකටවත් අපි හිටපු කාමරයට ආයේ යන්න එපා" මා එය

කීවේ නිශ්චිත හඬකිනි. එයින් වේළුගේ නළල රැලි ගැසී ගියේ ය. යාපනයේ යුද සමයේ පවා බුද්ධි අංශයත් සමඟ සේවය කළ, මීටත් වඩා දරුණු අපරාධ සියැසින්ම දැක ඇති වේළු මා කාමරයේ දී දුටු දෙය කිසිසේත්ම විශ්වාස නොකරනු ඇත.

'ඒත් මාතර "තිහගොඩ" නමින් හැඳින්වූ ගම්මානයේ හැදී වැඩුණු, එම ගම්මානයේම දක්ෂ වෙදැදුරෙකු වූ පියෙකුට දාව උපන් මම මෙය කෙසේනම් විශ්වාස නොකර සිටින්න ද?'

මා එය දුටුවෙමි. ඇය නිවසින් පලා ගොස් නැත. වේළු ඇය ගැන එම සාවද්‍ය ප්‍රකාශය කරත් ම ඇය කාමරයට ආයේ එය එසේ නොවන බව මට පෙන්වීමට විය යුතු ය. කුමක් හෝ හේතුවක් නිසාවෙන් ඇය මිය ගොස් ඇත. ඒත් ඇය තවමත් මෙම නිවසෙම වාසය කරයි.

***

මා යළිත් පොලිස් ස්ථානයට යද්දී උදෑසන ආලෝකය වැටෙමින් තිබුණේ ය. පොලිස් ස්ථානයට ගිය මා මගේ කාර්යාල කාමරයට වැදී කල්පනා කරන්නට පටන් ගත්තෙමි.

'ඇය එම නිවසේම සිටියි.' කුමන හෝ හේතුවකට ඇය එම නිවසින් නික්ම ගොස් නැත.

මා "තිහගොඩ" වෙදදුරෙකුගේ පුතෙකු යැයි මා ඔබට කීවෙමි. මගේ පියා කළේ වෙදකම පමණක් ම නොවෙයි. ඔහු දක්ෂ වෙදෙකු සේ ම ගුරෙකු ද විය. යන්ත්‍ර මන්ත්‍ර ගුරුකම් සියල්ලෙහි ම දක්ෂයෙකු වූ ඔහු මාව ඒ සියල්ලෙන්ම ඈත් කර තැබීමට උත්සහ කළේ ය. අඩුම තරමින් වෙදකමවත් මාට හට ඉගැන්වීමට තරම් වුවමනාවක් ඔහුට නොවී ය. ඒ සඳහා ඔහු තෝරා ගත්තේ මගේ නැගණියව යි.

මාව සම්පූර්ණයෙන් ම ඒවායින් ඈත් කළ ඔහු මට හොඳින් ඉගැන්වීම පමණක් කළ අතර, මා සාමාන්‍ය පෙළ සමත් වූ පසුව කොළඹ පාසලකට යවා එහි නේවාසිකාගාරයේ නැවැත්වීමටත් කටයුතු කරන ලදී.

එතැන් සිට මා ඔහුට වෛර කරන්නටත්, ඔහු ගැන ද්වේෂයෙන් කටයුතු කරන්නටත් පටන් ගතිමි. ඔහුගේ දැනුම උකහා ගැනීමට හෝ ඔහු දන්නා වෛද්‍ය ශාස්ත්‍රය ඉගෙන ගැනීමට මට වුවමනාවක් තිබුණේ නැත. ඒත් කුඩා කලදී ම මගේ මවගෙනුත් මා උපන් ගමෙනුත් මාව වෙන් කිරීම ගැන මා ඔහුට වෛර කරන්නට වීමි.

මම කොතරම් සාධාරණ දැයි මා දන්නේ නැත. සමහර විට ඔහු මගේ අනාගතය පෙර සිටම දකින්නට ඇත. එසේ නැතහොත් ඔහුගේ මාවතින් මාව සම්පූර්ණයෙන් ම වෙන් කොට මාව වෙනත් මාවතක ගමන් කරවන්නට

උත්සහ ගන්නට ඇත. ඔහු මිය ගිය දින පවා යළිත් ගමට ගිය විට, මට ඔහුගේ මරණය ගැන වේදනාවක් ඇති වූවේ නැත. මගේ දෑස් කඳුළින් පිරී ගියත් ඒ සැබෑ වේදනාවට ද, ජීවත්ව සිටි කාලයේ ඔහු මාව ඔහුගේ ජීවිතයෙන් වෙන් කිරීමට උත්සහ කිරීම නිසාදැයි මා නොදත්තෙමි.

කාර්යාලයට ආ පසුව පුටුවේ බරාදයට හිස තබා ගත් මා රාත්‍රියේ මා දුටු දර්ශනයත්, මගේ පියාගේ මතකයනුත් අතර සැරිසරමින් සිටියෙමි. ඒ සමඟ ම මට පැයක පමණ කාලයකට නින්ද යන්නට ඇත. මා යළිත් අවදි වූයේ මගේ ජංගම දුරකතනය නාද වෙන හඬිනි.

"සර්..."

"ඔව් වේළු.."

"සර්, හිරවෙලා තිබ්බ එකත් ගොඩ ගත්තා. ඒක අඳුරගන්න බැරි තරම් කුණුවෙලා."

"ළමයෙක්ගෙද?" මා ඇසුවෙමි.

"නැහැ සර්.. පිරිමි කෙනෙක්ගේ."

"පිරිමි කෙනෙක්?"

"ඔව් සර්, හැබැයි කවුද කියලා හරියට අඳුරගන්න බැහැ. මම අර සේන කියන කෙනාගෙනුත් ඇහැව්වා. ඒ මනුස්සයටත් හරියට අඳුරගන්න බැහැ."

"හරි... බොඩීස් සේරම හොස්පිටල් එකට යවන්න. ඔය ඉඩම සම්පූර්ණයෙන් ම සීල් කරන්න" කී මම මොහොතකට නැවතුණෙමි.

"අර සේන කියන හාදයා, මිනිහවත් එක්කගෙනම පොලිසියට එන්න. මට මිනිහත් එක්ක කතා කරන්න ඕන."

"හරි සර්" කී වේළු ඇමතුම විසංධි කළෙන් මම යළිත් පුටුවට හිස තබා ගතිමි.

"තවත් පිරිමි මළ සිරුරක්" මා කල්පනා කලෙමි. ඒ කවුරුන් හෝ වේවා රස පරීෂන වාර්තාව හරහා ඒ ගැනත් හෝඩුවාවක් ලබා ගැනීමට හැකි වනු ඇත.

"ඊටත් කලින් මේ සියල්ලම නිරාකරනය කරගත යුතු මාර්ගයක් සොයා ගත යුතු ය." මා යළිත් දෑස් වසා ගත්තෙමි.

***

එයින් ස්වල්ප වෙලාවකට පසුව වේළු, සේන නමින් හැඳින්වූ පුද්ගලයාත් සමග පොලිසියට පැමිණියේය. ඔහු පැමිණි විගසම කට උත්තර ලියාගන්නා කොස්තාපල්වරයෙකුටත් කාමරයට එන්නැයි කියූ මා ඔහුගේ කට උත්තරය සටහන් කර ගන්නැයි පැවසුවෙමි. කොස්තාපල්වරයා ද මා ඉදිරියේම වූ එක්

අසුනක ඉඳගත්තේ ය. අනෙක් අසුනේ සේන ද ඊට නුදුරින් වේළු ද ඉඳගෙන සිටියේ ය.

කොස්තාපල්වරයා රාජකාරිය පටන් ගත්තේ ය. මම ඔවුන් කාමරයට එන විට ඉඳගෙන සිටි පරිද්දෙන්ම පුටුවේ බරාදයට හිස තබාගෙන ඔහු කියන සෑම දෙයක් ම අවධාරණයෙන් යුක්තව අසාගෙන සිටියෙමි.

"සම්පූර්ණ නම?"

"සේන වික්‍රමගේ"

"වයස?"

"අවුරුදු හතළිස් පහක්"

"රස්සාව?"

"ටවුමෙම ලී මෝලක් කරනවා. 'සේන ලී මෝල' ඒක මගේ"

"පදිංචිය?"

"දෙනියාවල, නොම්මර 12. අපේ ගෙදරට එහා පැත්තේ තමයි ඔය බංගලාව තියෙන්නේ. එහා පැත්තේ කිව්වට කිලෝමීටරයක් විතර ඈතින්."

ඔහු එසේ පවසත් ම මගේ දෑස් ඉබේම විවර විය.

"නොම්මර එකොළහා?" මා ඇසුයෙමි.

"මොකක්ද සර්?"

"බංගලාවේ නොම්මරය?"

"ඔව් සර්, ඒ බංගලාව නොම්මර එකොළහා. මගේ ගෙදර නොම්මර දොළහා."

මගේ දෑස් විශාල විය. ඒත් මා එය යටපත් කරගනිමින් යළිත් පුටුවට හේත්තු වී ඉඳගත්තෙමි. වේළු මා ඉදිරියෙන් ම ඉඳගෙන මා දෙස විමසිල්ලෙන් බලා සිටිනු පෙනෙයි. ඔහුට මගේ වෙනස්කම දැනෙන්නට ඇත.

"තමුන් සහ මරණය සිදුවුණ නිවසේ මිනිසුන් සමඟ තියෙන සම්බන්ධය?"

කොස්තාපල්වරයා යළිත් ප්‍රශ්න කිරීමට පටන් ගත්තේ ය.

"කිසිම සම්බන්ධයක් නැහැ සර්. අසල්වැසියෝ.. එච්චරයි. ලොකු ඇයි හොදැයියක් නැහැ."

"අමනාපයක්?"

"නැහැ සර්. අමනාපයකුත් නැහැ.. ඇයි හොදැයියකුත් නැහැ... මම කොහොමත් මිනිස්සුන්ව අතේ දුරින් ආශ්‍රය කරන කෙනා... ලොකුවට සම්බන්ධයක් තියාගන්න යන්නෑ" ඔහු කීවෙන් මම දෑස් අඩවන් කොටගෙන ඔහු දෙස බැලුයෙමි.

සහජ වූ ඥානයෙන් ම මා විවිධාකාර වූ හැකියාවන්ගෙන් යුක්ත වූ අයෙකු

බැව් මා ඔබට කීවෙමි. මිනිසුන් සමඟ කතා කරද්දී ඔවුන්ගේ සිතෙහි ඇති වන තිගැස්සීමත්, වෙනස්කම් සහ ඔවුන් යමක් වසන් කරද්දී එය අවබෝධ කරගැනීමේ ගුප්ත වූ ඥානයක් ද මට ඇතැයි මා සිතමි. සේන නම් පුද්ගලයා ඔහු සහ අසල්වැසි නිවස සමඟ සම්බන්ධයක් නැතැයි පවසද්දි මා ඔහු දෙස විපරමින් බැලුවේ ඒ නිසාවෙනි.

"හරි... සිද්ධවුණ දේත් පැහැදිලිව කියමු" කොස්තාපල්වරයා ඔහුගේ පොතෙහි පිටුවක් හරවමින් සියල්ලම ඒ ආකාරයෙන්ම ලියා ගැනීමට යන්ත දරමින් පැවසුවේ ය. මම ද එයට අවධානයෙන් කන් දුන්නෙමි.

"මම කලින් කිව්වා වගේ සර්... සිද්ධවුණේ මේක. මම බොහෝම පිරිසිදුව ඉන්න කෙනෙක්. ඒ වගේම ළඟපාතින් මොකක්හරි ගඳක් එනවනම් ඒකත් මට හොඳට තේරෙනවා. ඔය කියන බංගලාවේ ජීවත්වුණා දරුවන් පස් දෙනෙක්. සේරම අය පොඩි දරුවන් එක්කෙනෙක් විතරක් ලොකු කෙල්ලෙක්. මම ඔය බංගලාව ගැන ඒ තරම් විපරම් කළේ නැති වුණාට, ඒ බංගලාවේ ඉන්න දරුවන් නම් නිතරම අපේ ගෙවල් ඉස්සරයින් යනවා එනවා මම දකිනවා. මගේ ගේ තියෙන්නෙත් ඔය බංගලාව තියෙන ඉඩමට කිලෝමීටරයක් විතර ඈතින් නේ, මට ඉඩම හරහා ඒ ගෙදරට යන්න බැහැ. මොකද ඔය බංගලාවේ හිටිය මිනිස්සු බංගලාව වටේම තියෙන ඉඩම් ටික විකුණලා. ඒවා අරගත්තු එවුන් ඒ ඉඩම්වල කම්බි වැටවල් ගහලා වෙන් කරගෙන තියෙන්නේ. ඉතින් බංගලාව පැත්තට යනවනම් මම යන්න ඕනෙත් වැලි පාර හරහා. ඔය ගෙදර දරුවනුත් එහෙමයි. ඒ දරුවන්වත් මම දකින්නේ ඔය වැලි පාර හරහා එහාට මෙහාට යද්දී... හැබැයි මම කලිනුත් කිව්වේ සර්, මට ඔය බංගලාවේ අයත් එක්ක සම්බන්ධයක් නැහැ. ඒ නිසා මම කා එක්කවත් කතාවට යන්නෙත් නැහැ. ඔය දරුවන් දවසට දෙතුන් පාරක්ම වැලි පාර දිගේ එහාට මෙහාට යනවා එච්චරයි..." ඔහු එසේ පවසා මොහොතක් කල්පනා කළේ ය.

"ඔව්... ඔය ගෙදර දරුවන් පස් දෙනෙක් හිටියා.. මට ඒක හොඳටම විශ්වාසයි. කාගේ කවුද දන්නෑ.. හැබැයි පොඩි දරුවන් පස් දෙනෙක්. සේරමලා වයස අවුරුදු පහළොවට අඩු අය. හා.. එක කෙල්ලෙක් ඒකී ටිකක් ලොකුයි... අර මැරිලා හිටිය ගැහැනු උන්දෑ වගේ උස මහත කෙනෙක්. මම හිතන්නේ ඒ දෙන්නගේ දුවෙක් වෙන්න ඕන."

"එතකොට තමුන් ඒ ගැන හරියටම විස්තරයක් කියන්න දන්නෑ?" කොස්තාපල් හරස් ප්‍රශ්නයක් ඇසුවේ ය.

"නැහැ සර්.. මම කිව්වේ මට ඔය අනිත් මිනිස්සු ගැන වැඩක් නැහැ කියලා. අනික ඔය බංගලාකාරයෝ උපතින්ම මහා ඌෂ්ණෙන් ඉන්න අයනේ" ඔහු බොල් දත් පෙන්වා මද සිනහවක් පෑවේ ය.

"අනික මම මෙහෙට පදිංචියට ඇවිත් අවුරුද්දක්වත් නැතිව ඇති. කොහොමත් අපි වගේ අලුතින් ආපු අයව ඒ උන්දලා ගණන් ගන්නෑනේ මහත්තයා."

"හ්ම්, එතකොට තමුන් මේ ගැන පොලිසියට පැමිණිලි කළේ කවද්ද?"

"ඊයේ රෑ. ඔව්.. ඊයේ හවස් වරුවේ තමයි මම ඔය බංගලාව පැත්තට ගියේ. ඒකත් බලාගෙන ඉඳලා ඉඳලා බැරිම තැන. මහත්තයලම දැක්කනේ ඒක උහුලන්න පුළුවන් ගඳක් ද? මගේ ගේ තියෙන්නේ ඔය බංගලාවේ ඉඳන් හුළං හමන පැත්තේ. ඒ නිසා මට ඒ ගන්දස්සාරේ වැඩිපුර දැනෙන්න ඇති. අනික අහල පහළ කියලා වෙන ගෙවල් තියෙන එකක් යෑ. අනිත් ගේ තියෙන්නෙත් මීටර් ගානක් ඈතින්නේ" කී ඔහු මදක් නතර වී කල්පනා කරන්නට විය.

"ඔව් මම හිතන්නේ එහා පැත්තේ ගෙදරටත් මීටර් පන්සීයක් විතර ඈතයි. කොහොමහරි මහත්තයා... මට දවස් ගානක ඉඳන් ඔය බංගලාව පැත්තෙන් එන ගන්දස්සාරේ දැනුණා. මම මුලින් හිතුවේ මීයෙක්වත් කුණු වෙලාද කියලා. ඒත් දවස් තුන හතරක් එක දිගට දැනෙද්දි මට ටිකක් සැකයකුත් ආවා. අනික මම අර කලින් කිව්ව පොඩි එවුන් පස් දෙනා, උන් පස් දෙනාවත් කාලෙකින් දැක්කේ නැහැ. සමහර දවස් වලට ඒ දරුවන් සෙල්ලම් කරන සද්දේ හරි ඇහෙනවා. ඒකවත් නැහැ. ඉතින් ඒ සැකේටත් එක්කමයි මම හිතුවේ ඔය බංගලාව පැත්තේ යන්න ඕන කියලා. එහෙම හිතලා තමයි මම ඔය පැත්ත පරීක්ෂා කරන්න පටන් ගත්තේ."

කොස්තාපල්වරයා එක දිගටම ලියාගෙන ගොස් පිටුව අනිත් පැත්ත හරවා යළිත් ලියන්නට පටන් ගත්තේ ය.

"මම මුලින් ම බංගලාවේ දොර ළඟට ගිහින් බැලුවා. කවුරුත් නැහැ. කිහිප වතාවක්ම තට්ටු කළා. ඒත් නැහැ... දොර ජනේල් සේරම හෝ ගාලා ඇරලා දාලා ගෙදර කවුරුත් නැති වෙන්න බැහැනේ මහත්තයා. ඒ හින්දා මම පොඩ්ඩක් බංගලාව වටේ ඇවිදලා විපරම් කරලා බැලුවා... ඒත් කවුරුවත්ම හිටියේ නැහැ... ඔන්න ඔය ගමන තමයි අර ගන්දස්සාරේ එන ළිඳ ළඟට කිට්ටු කරලා බැලුවේ" ඔහු යළිත් නතර විය.

"තමුන් එතකොටයි මළසිරුර දැක්කේ?" කොස්තාපල් ප්‍රශ්න කළේ ය.

"ඔව් සර්... එකක් නෙමෙයි දෙකක්... මළ සිරුරවල් දෙකක්.. දෙකම ළිඳේ පා වෙවී තිබ්බේ. මම ඒත් එක්කම තමයි පොලීසියට කෝල් එකක් ගත්තේ" ඔහු දිගු හුස්මක් පිටතට යැවී ය.

"එච්චරද?"

"ඔව් සර්..."

කොස්තාපල් පැමිණිල්ල ගත් බවට අත්සන් කොට මා දෙසත් බලන ගමන් පොත ඔහු ඉදිරියේ තැබුවේ ය.

"හා මෙතැන අත්සන් කළානම්."

ඔහු කට උත්තර පොතේ අත්සන් කොට මා දෙසත්, වේළු දෙසත් මාරුවට බැලුයෙන් මම ආසනයෙන් හිට ගත්තෙමි.

"හරි.. තමුන්ට යන්න පුලුවන්.... ඊට කලින්..." මා ඔහු දෙසට නැඹුරු වීමි.

"ඒ ගෙදර හිටියා කිව්ව ගැහැනු ළමයා, තමුන් ඒ ළමයව අඳුරන්නෑ කිව්වා නේ?"

"ඔව් සර්.."

මා ඔහුගේ දෑස් දෙස බැලුවෙමි.

"කවදාවත් කතා කරලවත් නැහැ?"

ඔහු මොහොතක් නිහඬ විය. මා ඔහු දෙසම බලාගෙන සිටීම ඔහුගේ චකිතයකට හේතුවන්නට ඇත.

"නැහැ... සර් කවදාවත් නැහැ" ඔහු කීවේ ය.

මා එම ප්‍රශ්නය ඇසුවේ හේතුවක් නිසාවෙනි. ඔහු මුලින් ම එම ගැහැනු ළමයා ගැන මතකයට නගද්දී ඔහුගේ කටහඬ සැකෙවින් වෙනස්වී ගියේ ය. මා එය හොඳාකාරවම දුටුවෙමි. ඔහු නිසැකවම ඇය සමඟ සමීපව සිටින්නට ඇතැයි යන සැකය මට ආයේ ඒ නිසාවෙනි.

"හරි තමුන්ට යන්න පුලුවන්." මම එය එතැනින් අවසන් කළෙමි.

***

කොස්තාපල්වරයා, සේන වික්‍රමගේ නැමැත්තාගේ අත්සනත් ගෙන ඔහුව පිටත් කොට යැවූ පසුව වේළු විත් මගේ මේසය ඉදිරියෙහි ඉඳගත්තේ ය.

"සර්, මිනිහා ගැන මගෙත් පොඩි සැකයක් තියෙනවා. ඊයේ අර ගෙදරට ගිය වෙලාවේ ඉඳන් මිනිහා එතැනින් හෙලවුණේවත් නැහැ. මම ඕකව එක්කගෙන පොලිසියට එනකන්ම මිනිහා හිටියේ ළිඳ ගාව."

මා වේළු කියූ දෙය අනුමත කරන්නට මෙන් හිස සැලුවේ ය. ඒත් සමඟම සාක්කුවෙන් සිගරට් පෙට්ටිය අතට ගත් මම එය වේළුට දික් කළෙමි.

"මේක ඇතුළේ?"

ඔහු එසේ අසන්නාක් මෙන් මුහුණ වෙනස් කර ගත්තේ ය.

"ඒකට කමක් නැහැ අයිසේ" කියූ මම අතේ වූ ලයිටරයෙන් ඔහුගේ සිගරට්ටුව පත්තු කොට මගේ එකද පත්තු කර ගනිමින් මදක් කල්පනා කරන්නට වීමි.

වේළු "සේන" ගැන කියූ දෙය ඇත්තකි. එය මටත් දැනී තිබුණේ ය. ඒත් ඊට කලින් මට විසඳා ගත යුතු ප්‍රශ්නයක් ඇත. සිගරට්ටුවේ දුම ඉහළට යවන ගමන් මා කල්පනා කළේ ඒ ගැන ය. වේළු ගොස් කාර්යාල ජනේලයේ අනිත් පළුවත් විවර කොට ජනේලය සමඟම වූ සිමෙන්ති පඩිය මත හිඳගත්තේ ය. ඔහු ජනේලය විවර කරත්ම ජනේලය හරහා ආ සුළං පාරක් මගේ ශරීරයේ වැතිරිණ. එම සීතල සුළං පාරත් සමඟ ඊයේ රාත්‍රියේ මට දැනුණු සීතලත්, තිගැස්මත්, දර්පණයෙන් මා දුටු ප්‍රතිබිම්බයත් මතකයට ආවේ ය.

"අපිට පොලිස් බල්ලෝ කිහිප දෙනෙක් ඕන කරනවා" මා එයත් සමඟම කීවෙමි.

"ගලේවැව පොලිසියෙන් ගන්න පුලුවන් සර්."

"හ්ම්" මම මිමිණුවෙමි.

සීතල සුළං සේම උදෑසන හිරු එළියත් ජනේලය තුළින් කාමරයට වැටෙමින් ඇත. වේළු සිගරට්ටුව උරණ ගමන් දුම් ඉවතට යවන්නට ජනේලය පැත්තට දුම පිඹියි.

"සර් කියන්නේ ඒ වයසක ගැහැනු කෙනත් මැරිලා කියල ද?"

"ඔව්.. මැරිලා. ඒකේ සැකයක් නැහැ."

මා එසේ කියද්දි වේළුගේ මුහුණෙන් මතුවූයේ ප්‍රශ්නාර්ථයකි. මට එය වටහා ගත හැක.

"මට ඒක විස්තර කරන්න බැහැ වේළු" කියූ මම ඔහුගේ ප්‍රශ්නාර්ථයකින් යුක්ත වූ මුහුණ දෙස මොහොතක් බලා සිටියෙමි. ඔහුට මෙය කිව යුතු දැයි මම දන්නේ නැත. එසේ කීවත් ඔහු එය විශ්වාස නොකරනු ඇත.

"අපිට බංගලාව ආයෙමත් පරීක්ෂා කරන්න වෙනවා. වේළු ගලේවැවට කතා කරලා බල්ලෙක්ව ගෙන්න ගන්න. අපි අදම මේක ඉවර කරන්න ඕන. තව කොස්තාපල්ලා දෙන්නෙක්වත් ගෙන්න ගන්න, බංගලාවත් එක්කම ඒ අවට තියෙන ඉඩම් කට්ටි ටිකත් පරීක්ෂා කරන්න ඕන. විශේෂයෙන්ම අර මිනිහා" මම කල්පනා කරමි.

"සේන?"

"ඔව් ඒ සේන කියන කෙනාගේ ගේත් පරීක්ෂා කරන්න ඕන. ඒකට අපිට වොරන්ට් එකක් ගන්න වෙනවා. මම කොළඹට කතා කරලා ඒක ෆැක්ස් කරගන්නම්. අද හවස් වරුවේ අපි බංගලාවේ වැඩේ පටන් ගමු."

"හරි සර්" වේළු එසේ පවසා දුම්වැටිය ජනෙලයෙන් පහතට විසි කොට නැගී සිටියේ ය. ඒත් සමඟම ඔහු ජංගම දුරකතනය ගෙන ගලේවැව පොලිසියට කතා කරන්නට පටන් ගත්තෙන් සිගරට් දුමත් ඉහළට විසිකරමින් මම යළිත් නිහඬ වූවෙමි. එම නිහැඬියාවත්, ජනේලයෙන් එන ආලෝකය සහ උදෑසන සීතල සුළඟත් සමඟ මට තවත් දෙයක් මතකයට ආවේ ය.

"අද අපි මෙහෙට ඇවිත් දවස් එකොළහයි" සුලෝචනා මිමිණූ එම වචන පේළිය මනසෙහි තැවරෙද්දි මම දෑස් හරවා මගේ කාමරයේ වූ දින කැලැන්ඩරය දෙස බැලුවෙමි. අපි දෙනියාවලට පදිංචියට ආවේ ජූලී මස පළවෙනිදා ය. අදට දවස් එකොළහක් ගෙවී ගොස් ඇත. 'එකොළහක්' මම කැලැන්ඩරය දෙස බලාගෙනම කල්පනා කරන්නට විමී.

'මෙය අහම්බයක් විය හැක'

***

එදින සවස් යාමයෙහි අපි පරීක්ෂාව ආරම්භ කළෙමු. වේළු විසින් ගලේවැව පොලිසියේ සිටි ඔහුගේ මිතුරෙකු ලවිවා පොලිස් සුනඛයෙකු පරීක්ෂාව සඳහා ගෙනවිත් තිබිණ. ඌ සමඟ පොලිස් සුනඛයින් මෙහෙයවීමේ කොස්තාපල්වරයෙකු ද පැමිණ සිටි අතර දෙනියාවල පොලිසියෙන් තවත් කොස්තාපල්වරුන් දෙදෙනෙකු ද අපි පරීක්ෂණය සඳහා සහභාගි කර ගත්තෙමු.

ඊයේ රාත්‍රියට වඩා හොඳින් හිරු එළිය වැටී ඇති මේ මොහොතේ බංගලාව සහ ඒ අවට ඇති සෑම බිම් අඟලක් ම මනා පැහැදිලි කමකින් යුක්ත ය. සේන විසින් කියූ ආකාරයටම මෙය විශාල ඉඩම් ප්‍රමාණයක් හිමි බංගලාවකි. ඒත් කුමක් හෝ හේතුවක් නිසාවෙන් බංගලාව වටා ඇති සෑම බිම් කඩක්ම පාහේ පිටස්තරයන්ට විකුණා දමා තිබුණෙන් තැනින් තැන ගසා ඇති කම්බි වැටවල් සහ තාප්ප නිසාවෙන් බංගලාව වටා භූමිය තවත් කුඩාවට පෙනෙයි. එම කම්බි වැටවල් නිසාම පිටත සිටින කිසිවෙකුටවත් වැලි පාර හරහා හැරෙන්නට බංගලාව තුළට ඇතුල් වීමටද හැකියාවක් නැත. එසේම බංගලාව වටා ඇති භූමියත් කාලයකින් හෙළිපෙහෙළි කර නොතිබුණෙන් ඒ සියල්ලෙහිම වල් ගස් වැවී ඇත. යාන්තමින් හෝ වැලි පොළොවක් තිබුණේ බංගලාවට යාබදවම වූ මිදුල කොටසෙහි පමණකි.

අපි පරීක්ෂණය පටන් ගත්තේ බංගලාවේ දිරා ගිය ගේට්ටුව ඇති මානයේ සිට ය. එතැන මා සමඟ සිටි කොස්තාපල්වරු දෙදෙනා දෙස බැලූ මම, එක් අයෙකුට වේළු සමඟ බංගලාවේ වම්පසට යන ලෙසත්, අනිත් කෙනාට මා සමඟ දකුණුපස පරීක්ෂාවට එන ලෙසත් පැවසුවෙමි. පොලිස් සුනඛයා සමඟ සිටි කොස්තාපල් වරයා මුලින්ම බංගලාව වටා පරීක්ෂා කොට ඉන්පසුව අසළ වූ ඉඩම් කිහිපයත් පරීක්ෂා කළ යුතු විය. අපි පරීක්ෂණය පටන් ගත්ම පොලිස් සුනඛයා කොස්තාපල්වත් ඇදගෙන දුවන්නට පටන් ගත්තේ ය.

හෝරාවක පමණ කාලයක් අපි බංගලාවට යාබදව වූ මුළු භූමි භාගයම පරීක්ෂා කළෙමු. මා ඔබට කලින් කී පරිද්දෙන්ම මෙම භූමියේ බංගලාවට වඩාත් ආසන්නව වූ කොටස පමණක් වැලි පොළොවකින් යුක්ත වූ අතර අනෙත් සියලුම තැන් වල් බිහිවී තිබුණේ ය. ඒ අසල කම්බි ගසා වෙන් කොට තිබූ ඉඩම් බොහෝමයක්ම උසට වැඩුණු විවිධාකාර ගස්වැල්වලින් යුක්ත වූවේ ය. බංගලාව අසළ සෝදිසි කළ පසුව එම ඉඩම් අතුරින් ඇතුළුවීමට හැකියාවක් තිබුණු ඉඩම් කිහිපයක් ද අපි පරීක්ෂාවට ලක් කළෙමු. ඒත් එය මුළුමනින්ම අසාර්ථක වූ පරීක්ෂණයක් විය. එයින් කිසිම වැදගත් හෝඩුවාවක් සොයා ගැනීමට හැකි වූයේ නැත.

අවසානයේදී බංගලාව වටා නිරුත්තර ඇවිදීමකින් වෙහෙසට පත් වූ අපි සියල්ලෝම යළිත් ගේට්ටුව අසලටම විත් හිට ගත්තෙමු. පොලිස් සුනඛයාත් කිසිඳු උනන්දුවකින් තොරවම (බංගලාව වටා දිවීමෙන් වූ වෙහෙසින්) හති

හරිමින් සිටියේ ය.

"වැඩක් වුනේ නැහැනේ සර්" යැයි යළිත් ගේට්ටුව ආසන්නයට එද්දි වේළු මා දෙස බලමින් කීවේ ය.

මමද "ඔව්" යැයි පවසමින් සිගරට්ටුවක් ගෙන උරන්නට පටන් ගත්තෙමි. එවිට මා අසළ සිටි සුනඛයා මගේ සපත්තුව ලෙව කන්නට පටන් ගත්තේ ය.

"මූටත් කිසිම ඉවක් ආවේ නැහැනේ?" මම ඌ දෙස බලමින් එතැන සිටි කොස්තාපල්ගෙන් විමසුවෙමි.

"ඒකනේ සර්.. වෙනදටනම් මොකක් හරි දෙයක් හොයා ගන්නවා" කී කොස්තාපල් සුනඛයාගේ හිස අතගාන ගමන් කීවේ ය.

"අද මෙහෙම වුණාට මූ හොඳට ඉව තියෙන එකා සර්. ඕන දෙයක් සුරුස් ගහලා හොයා ගන්නවා. අද මොකක් වුණාද දන්නෑ. ඔහේ ඇවිද්ද එක විතරයි වුණේ. අර ළිඳ ගාවනම් ටික වෙලාවක් ඉව කළා" යි කොස්තාපල් අපට දකුණු පසින් වූ ළිඳ පෙන්වා කීවේ ය.

"හ්ම්" යැයි මමද සිගරට් දුමක් අහසට යවන ගමන් ඒ දෙස බැලුයෙමි.

"ඔතන තමයි ඊයේ මළකඳන් දෙක ගොඩ ගහලා තිබ්බේ. ඒක නිසා වෙන්න ඇති" කී මම සිගරට්ටුවේ අන්තිම කොටසද උරා එය බිමට දමා පාගා දැමුවෙමි. ඒත් සමඟම හිසේ තිබුණු හිස් වැස්මත් ගලවා අතට ගත් මම ආකාසය දෙස බැලුවෙමි. තවත් සුළු වෙලාවකින් අන්ධකාරය වැටෙනු ඇත. ඊයේ රාත්‍රියේ සිට මේ මොහොත වෙන තෙක්ම රාජකාරියේ නිරතුරුව සිටියෙන් අප සියල්ලෝම සිටියේ තෙහෙට්ටුවෙනි.

"අපි එහෙනම් යමු" මා කීවෙමි.

"වේළු, තමනුත් ගෙදර යනවා. හෙට උදේට ෆොරෙන්සික් එක ගේ පරීක්ෂා කරන්න එනවා. මට හෙට උදේම හෙඩ් ඔෆිස් එකට යන්නත් තියෙනවා" කී මම කොස්තාපල් දෙසට හැරී ඔහුටත් පිටත් වන්නැයි ඉඟි කරන ගමන් මගේ ජීපය දෙසට ඇවිද ආවෙමි.

වේළු ඔහුගේ මිතුරා සමඟ කතා කරමින් ඔහු පැමිණි වාහනය දෙසට යන්නට පටන් ගත්තේ ය. එය ගේට්ටුවට මීටර් කිහිපයක් එහායින් නවතා තිබිණ. පොලිස් කොස්තාපල්වරුන් දෙදෙනා ද සමඟ ජීපයට ගිය මම එහි ඉඳගත්තෙමි. කොස්තාපල් ජීපය පණ ගන්වා එය ගේට්ටුවෙන් පිටතට ගෙන යෑමට සැරසුණේ ය. මේ මොහොතේ වේළු සහ ගලේවැව කොස්තාපල් සමඟ කාරයට යමින් සිටි සුනඛයා එක්වරම බුරන්නට පටන් ගත්තෙන් මගේ අවධානය ඒ දෙසට යොමු විය. ඌ බංගලාවේ ගේට්ටුවට එහායින් වූ ගස් පේළියක් දෙස බලාගෙන බුරයි. කොස්තාපල්වරයා ඌව ආන්බාන් කරගෙන වහානයට ගෙන යෑමට යන්ත දරයි. මා ඒ දෙස සුළු වෙලාවක් බලා සිටියෙමි. වේළු කොස්තාපල්වරයා සමඟ කතා කරමින් සිටියෙන් ඔවුන්ට සුනඛයාගේ

මෙම හැසිරීමේ වෙනස දැනෙන්නට නැතුව ඇත. ඒත් ඒ දෙස විමසිල්ලෙන් බලා සිටි මට එම හැසිරීමට කුමක් හෝ හේතුවක් ඇතැයි යන සැකය ඇති විය. ඒ නිසාම ඉක්මනින්ම ජීපයෙන් බිමට බැස ගත් මම ඔවුන් ඇවිද ගිය වැලි පාර දෙසට යන්නට පටන් ගත්තෙමි.

සුනඛයා බිරුවේ ගේට්ටුව අසළම ඇති කම්බි වැටකින් වෙන් කර තිබුණු ඉඩමක් දෙස බලාගෙන ය. එම ඉඩමේ කම්බි වැට ඉදිරියෙන් තහඩුවලින් ගැසූ දිරාපත්වී ගිය ගේට්ටුවකි. එම ගේට්ටුව යකඩ දම්වැලකින් බැඳ ඉබ්බා දමා ඇත. මා එය ඉදිරියට ගොස් නතර වීමි. වේළු සහ සාජන්වරයාද එතැනම නතර විය. සුනඛයා තවමත් බුරයි. ඌගේ බිරීම මා එතැනට ගොස් නතර වෙත්ම තවත් වැඩි වන්නටත්, ඌ එම කම්බි වැට අස්සෙන් රිංගීමට මෙන් පාදයන් ඉහලට ඔසවමින් මුරණ්ඩු වන්නටත් වූවේ ය.

"ඌව අත හරින්න"යි මම කොස්තාපල්ට කීවෙමි.

කොස්තාපල් එක් වරම බල්ලාව ඌගේ දම්වැලෙන් නිදහස් කර යැව්වේය. බල්ලා කම්බි වැටේ හිඩැසින් පැන, ඉඩම තුළට වේගයෙන් දිව ගොස් එහි වූ විශාල රුස්ස ගස් දෙකක් අසළ එහාට මෙහාට දුවමින් බුරන්නටත්, පොළව පහුරු ගාන්නටත් පටන් ගත්තේ ය.

"සර් ඌට මොකක් හරි අහුවෙලා" කොස්තාපල් ඒ මොහොතෙම කීවෙන් මමත් වේළුත් වහාම ක්‍රියාත්මක වූවෙමු. තහඩු ගේට්ටුවට ඉබ්බා දමා තිබුණත් එය වටා ඇති කම්බි වැටෙන් රිංගීම අපහසු දෙයක් නොවී ය. බල්ලා විසින් රිංගා ගිය ඉසව්වේම කම්බි මඳක් ඈත් කළ අපි එතුළින් රිංගා ඇතුළට ගියෙමු. අප අසළට එනවාත් සමඟම බල්ලා ඌ බුරමින් සිටි ස්ථානයේම (ගස් දෙක අතර වූ වැලි තීරුව) පහුරු ගාන්නට පටන් ගත්තේ ය. මාත් සමඟ ජීපයේ සිටි කොස්තාපල්වරු දෙදෙනා ද එතැනට දිව එන්නට විය.

"සර් මෙතැන පොළව කවුරු හරි එළි කරලා තියෙනවා. මේ.."

සුනඛයා පොළව පහුරු ගාද්දි ඌව යළිත් ගාංවුවට බැඳගත් සාජන් එතැන වූ වැලි පොළව දෙස බලා කීවේ ය. ඔහු කී ආකාරයටම පොළවේ ගස් දෙපළ අතර ඇති කොටස අනිත් තැන්වලට වඩා එළි පෙහෙළි වී ඇත. කිසිවෙකු හෝ නිසැකවම මෙම කොටස හාරන්නට ඇත.

"පියසෝම, අර බංගලාව පිටිපස්සේ සවලක් හේත්තු කරලා ඇති. ඉක්මනට ගේන්න" කී මම එතැන සිටි මැදි වයසේ කොස්තාපල්වරයෙකු වූ පියසෝමව යළිත් බංගලාව කරා පිටත් කර යැව්වෙමි.

පොලිස් සුනඛයා අවසානයේ දී ඌගේ කාර්යය කර ඇත. මගේ සිත එයින් ප්‍රබෝධයට පත් වූ බැව් කිව යුතු ය. මෙතැන කුමක් හෝ තිබිය යුතු ය. නිසැකවම මෙතැන කුමක් හෝ වළ දමා ඇත. ඒ කුමක් විය හැකි ද?